# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2222/25 - 2021 අප්‍රේල් මස 06 වැනි අඟහරුවාදා - 2021.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (2ඇ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

ගාල්ල, උණවටුන අරලිය උණවටුන හෝටල් ව්‍යාපෘතිය සඳහා මුහුදු ජල ප්‍රති ආස්‍රැති (ලවණ හරණ) පද්ධතිය හා මුහුදු පිටමුව සහ උණවටුන ඕලන්ද ඇල සඳහා වන අපජල පිරිපහදු පහසුකම් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

**පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව උණවටුන, යද්දෙහිමුල්ල, වැල්ලේ දේවාලය පාර ලිපිනයේ අරලිය බීච් හොටෙල් පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද අරලිය උණවටුන හෝටල් ව්‍යාපෘතිය සඳහා මුහුදු ජල ප්‍රති ආස්‍රැති (ලවණ හරණ) පද්ධතිය හා මුහුදු පිටමුව සහ උණවටුන ඕලන්ද ඇල සඳහා වන අපජල පිරිපහදු පහසුකම් සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2021.04.06 දින සිට දින 30 ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

1. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10
2. මධ්‍යම පරිසර අධිකාරිය, නො. 104, ''පරිසර පියස'', කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල
3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අංක 811/ඒ, ජයන්ති පුර මාවත, බත්තරමුල්ල
4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල
5. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හබරාදූව
6. ප්‍රාදේශීය සභාව, හබරාදූව
7. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, ගාල්ල
8. මධ්‍යම පරිසර අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, ගාල්ල
9. දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, 5 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, ගාල්ල
10. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාලය, ගාල්ල


1A - G 34109 — 45 (2021/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම යෝජිත ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2021.04.06 දින සිට දින 30 ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

ආචාර්ය **එම්. එම්. එස්. එස්. බී. යාලේගම,**
අධ්‍යක්ෂ ජනරාල්, (රා.ආ.)
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල,
මාලිගාවත්ත, කොළඹ 10.

දුරකථන අංක : 011-2449754, 011-2387922, 011-2449197,
ෆැක්ස් අංක : 011-2438005, 011-2472623.

04 - 434

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.